# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2476/07 - 2026 පෙබරවාරි මස 17 වැනි අඟහරුවාදා - 2026.02.17

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

**(262 වන අධිකාරය) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 66අ(1) වගන්තිය යටතේ**
**මන්නාරම නගර සභාවේ**
**සභික ධූරයේ පුරප්පාඩුවක් පිරවීම**

පක්ෂ සාමාජිකත්වය අහිමිවීම හේතුකොට ගෙන මන්නාරම නගර සභාවේ තෝරා එවා ඇති සභිකයෙකුගේ ධූරයක් පුරප්පාඩු වී ඇති හෙයින් ද;

ඉහත කී ආඥාපනතේ 66අ(1) වගන්තිය යටතේ මන්නාරම නගර සභාව සඳහා තෝරා එවා ඇති සභිකයෙකු ලෙස පත් වූ සේවියර් ජෝන්ස් පොලිංටන් අයත් වන්නා වූ ශ්‍රී ලංකා කම්කරු පක්ෂය නම්වන පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහ (30) ක කාල පරිච්ඡේදය ඇතුළත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 9 වගන්තිය යටතේ නුසුදුස්සෙකු වී නොමැති අපේක්ෂකයෙකු, සභිකයෙකු වශයෙන් තෝරා පත්කර ගනු ලැබිය යුතුයැයි ප්‍රකාශ කරනු ලැබිය යුතු වූ ද, එම පක්ෂයට අයත් වන්නා වූ ද, එම මන්නාරම නගර සභාව සඳහා තෝරා එවිය යුතු සභිකයා පිළිබඳව තීරණය කිරීමට මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද;

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් එම පුරප්පාඩුව පිරවීම සඳහා ජේසුදාසන් ඇන්ටන් සහායදාසන් පෙරේරා නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින් ද;

මන්නාරම නගර සභාවේ තේරීම්භාර නිලධාරි කෙන්ගාතරන් මුගුන්තන් වන මම, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 66අ(1) වගන්තිය ප්‍රකාරව ක්‍රියා කරමින් ජේසුදාසන් ඇන්ටන් සහායදාසන් පෙරේරා, මන්නාරම නගර සභාවේ තෝරා එවා ඇති සභිකයෙකු ලෙස මෙයින් ප්‍රකාශ කරමි.

**කේ. මුගුන්තන්,**
තේරීම්භාර නිලධාරි,
මන්නාරම නගර සභාව.

2026 පෙබරවාරි මස 13 වැනි දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,
මන්නාරම.

EOG 02 - 0135

1A - PG 7526 — 08 (2026/02) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*